# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1991 අංක 44 දරන කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සංගතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1991 දෙසැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1991 අංක 44 දරන කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 10 වන දින]**

එල්. ඩී.—ඕ. 15/90

**කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

“කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයක් එකී මධ්‍යස්ථානයේ සාමාජිකයින් එකඟ වූ රීති අනුව එකී මධ්‍යස්ථානයේ අරමුණු සහ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්ය සඳහා කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී මධ්‍යස්ථානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන යෙස් ඇති හෙයින් සහ එම මධ්‍යස්ථානය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම යෝග්‍ය සහ මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මෙම පනත 1991 අංක 44 දරන, කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ආරම්භවීමේ දින සිට හා ඉන් පසු මෙහි පනතේ පළමුවන උපලේඛනයේ නම් සඳහන්කර ඇත්තා වූද, දැනට එකී කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානයේ (මෙහි මින්මතු “ මධ්‍යස්ථානය ” යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයින් වන්නා වූ තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයින් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත (මෙහි මින්මතු “ සංස්ථාව ” යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නේය. තවද ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේද එය පාවිච්චි කිරීමේ හා තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේය. කොළඹ ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය නමින් හැඳින්වෙන මෙම ආයතනයෙන් ඉස්ලාම් ආගමික අවබෝධය හා ඉස්ලාමීය අධ්‍යාපනය ලබා දීම වැඩි දියුණු කිරීම හා නංවාලීම සඳහා අවශ්‍ය මුදල් යෙදවීම, නඩත්තු කිරීම, සහ කළමනාකරණය කිරීම පිණිස :—

(i) ඉස්ලාම් ආගම පිළිබඳ රූපවාහිනී හා ශබ්ද වාහිනී පට සහිත පුස්තකාල සේවාවක් නොමිලේ පවත්වාගෙන යෑම ; සහ

(ii) ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු සම්බන්ධයෙන් ආශ්‍රිත හා පර්යේෂණ පුස්තකාල සේවාවක් හා "දාරුල් ඉස්ලාම්" යනුවෙන් ළමා පුස්තකාල සේවාවක් පවත්වාගෙන යෑම ;

(ආ) ලෝකයේ විවිධ ආගම් හා දර්ශන අතර වඩා හොඳ අවබෝධයක් නංවාලීම සඳහා අන්තර් ආගමික සම්මේලන සංවිධානය කිරීම ;

(ඇ) "ඉස්ලාම් අධ්‍යාපනික කටයුතු පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය" නමින් හැඳින්වෙන ආයතනයක් මගින් ඉස්ලාම් ආගමික අවබෝධය වැඩි දියුණු කිරීම සහ අධ්‍යාපනය නංවාලීම සඳහා අවශ්‍ය මුදල් යෙදවීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඈ) "දාරුල් ඉස්ලාම් ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය" යන නමින් ඉස්ලාම් අධ්‍යාපනික හා ආගමික ග්‍රන්ථ ප්‍රකාශන ආයතනයක් පිහිටුවීම ;

(ඉ) ඉහත කී පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතුව හෝ නැතුව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේද සංස්ථාවට නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය, කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික හා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීති වලට අනුකූලව තෝරා පත්කරගනු ලබන තවත් තැනැත්තන් දොළොස් දෙනෙකුට නො අඩු සංඛ්‍යාවකින් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් මගින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී මධ්‍යස්ථානයේ කළමනාකාර මණ්ඩලය ලෙස ධුර දරනු ලැබුවා වූද මෙම පනතේ දෙවන උපලේඛනයේ නම සඳහන් වන්නා වූද තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම හා නෙරපීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ නිලධරයන්ගේ සහ කළමනාකාර මණ්ඩලයේ බලතල, හැසිරීම හා ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන්ද කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීම්වල කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල තත් කාර්ය සඳහා සති දෙක කට නොඅඩු කාලයක් දැනුම් දී කැඳවනු ලබන යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය. එහි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එම ආකාරයෙන්ම එම රීති වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සහ මධ්‍යස්ථානයට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී මධ්‍යස්ථානයේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට මධ්‍යස්ථානයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම් මුදල් මෙම පනතේ කාර්ය සඳහා මෙම සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර එකී සභාපති හා ලේකම් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තෙකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරීම සහ බැහැර කිරීම කළ හැකි බව.

9. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු පැවරීමකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට, අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීති වලට යටත්ව සංස්ථාවට බලය ඇත්තේ ය. තව ද එවැනි සියලුම දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මෙම පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පළමුවෙනි උපලේඛනය (2 වගන්තිය)

එම්. සී. එම්. සාරුක්.
අල් හාජ් එම්. සී. ඒ. හමීඩ්.
අල් හාජ් ඒ. සී. එම්. රමීස්.
අල් හාජ් එස්. එල්. එම්. මුහාරි.
හමීඩ් කරීම්.
අල් හාජ් එම්. ජී. එම්. නෆීල්.
උනයිස් ෂමීල්
ඇෆ්ජාන්-උද්-දීන්.
එම්. සී. එම්. ෆාරුක්.
එම්. සී. එම්. හරීස්.
එම්. හුසයිට්.
එම්. එල්. ෆරීඩ්.
හිල්මි ෆරීඩ්.
නවුසාඩ් ෆරීඩ්.
එම්. එස්. ඉස්මයිල්.
මිරූස් සකාෆ්.
රිස්වි ෂෆීල්.
ඒ. සී. මූසා.
ඒ. එම්. එම්. අහමඩ්.
අස්ලම් ඔමාර්.
සතාර් හාෂිම්.
එස්. එම්. එච්. මොහමඩ් ඉර්ෂාද්.

අෂ්රෆ් අමීන්.

ඉක්බාල් හමීඩ්.

අබ්දුල් ලතීෆ්.

රමාසීන් සනූන්.

අස්මත් බූජා.

කයිසර් අමානුල්ලා.

දෙවැනි උපලේඛනය (5 (2) වගන්තිය)

කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| එම්. සී. එම්. සරූක් | සභාපති. |
| හමීඩ් කරීම් | ගරු ලේකම් |
| අල් හාජ් එම්. ඒ. එම්. නෆීල් | ගරු භාණ්ඩාගාරික |
| අල් හාජ් එම්. බී. එම්. සබීර් | කාරක සභික. |
| අල් හාජ් එම්. බී. එම්. රමීස් | කාරක සභික. |
| අල් හාජ් එස්. එල්. එම්. මූහාජි | කාරක සභික. |
| එම්. සුහයිර් | කාරක සභික. |
| ඒ. එම්. එම්. අහමඩ් | කාරක සභික. |
| උනයිස් හෆීල් | කාරක සභික. |
| අෆ්තාබ්-උද්-දීන් | කාරක සභික. |
| සිරාජ් සකාෆ් | කාරක සභික. |
| රිස්වි හෆීල් | කාරක සභික. |
| එච්. ජේ. හුසේන් | කාරක සභික. |
| එස්. එම්. එච්. මොහමඩ් ඉර්ෂාද් | කාරක සභික. |
| එම්. සී. එම්. ෆාරූක් | කාරක සභික. |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.